**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**University of Sri Jayewardenepura**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

**External Degrees and Extension Courses Unit**

# විශේෂ නිවේදනයයි

## 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය – 2022 නොවැම්බර් 20

### අයදුම්පත් කැඳවීම - අදියර IV - නාම ලේඛන අංක 07

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2022 නොවැම්බර් මස 20 වන ඉරිදා දින කොළඹ 07, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මේ සඳහා අදියර කිහිපයක් යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

පිරිනැමීමට නියමිත බාහිර උපාධි පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

1. ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය)
2. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
3. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය)
4. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය සහ පැරණි නිර්දේශය)
5. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය (නව නිර්දේශය සහ පැරණි නිර්දේශය)
6. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (පැරණි නිර්දේශය)
7. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය

**අදියර IV - නාම ලේඛන අංක 07**

මේ වන විට අවසාන වසර විභාග ප්‍රතිඵල නිකුත් කර ඇති ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සම්පූර්ණ කළ සිසුන් සඳහා මේ යටතේ උපාධි ප්‍රදානෝත්සවයට අදාල අයදුම්පත් කැඳවනු ලැබේ.

- අවසාන ප්‍රතිඵල නිකුත් කරන පිළිවෙල අනුව සුදුසුකම් ලබන උපාධිලාභීන්ගෙන් අයදුම්පත් කැඳවීම අදියර වශයෙන් ඉදිරියේ දී සිදු කරනු ලැබේ.
- 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සඳහා අදියර IV- නාම ලේඛන අංක 07 යටතේ අයදුම්පත් කැඳවන උපාධිලාභීන්ගේ නාම ලේඛනය පහතින් දක්වා ඇත.

උපාධි ප්‍රදානෝත්සවයට අදාල අයදුම්පත් අංක 1 සහ 2 http://external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය "V" රහිතව යෙදීමෙන් බාගත (Download) කර යුතුවේ.

අනතුරුව http://external.sjp.ac.lk යන වෙබ් අඩවියේ සඳහන් පරිදි 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2022 නොවැම්බර් 20 යන ශීර්ෂය යටතේ ඇති උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත්‍රය යන නමින් ඇති පෝරමය **(Google Form 1)** නිසි ලෙස පුරවා පහත සඳහන් ලේඛනවල scan පිටපත් එයට උඩුගත කර (upload) ඉදිරිපත් කළ යුතුය (submit).

1. සම්පූර්ණ කර ලද අයදුම්පත් අංක 1 සහ 2
2. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
3. දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවන ලද ගෙවීම් රිසිට්පත් 03 (එනම් උපාධි ප්‍රදානෝත්සවයට රු. 8000, විස්තරාත්මක සහතිකයේ රු. 1000 සහ නැවත ගෙවනු ලබන උපාධි ලෝගුවේ රු. 4000 යන රිසිට්පත් තුනෙහි මුල් පිටපත්)

**උපාධි ප්‍රදානෝත්සවය සඳහා ඉතා සීමිත කාල සීමාවක් පවතින බැවින්** ඉහත ලේඛන සියල්ල 2022.11.04 දිනට පෙර *(කාර්යාලීය වේලාවන් : පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා)* **බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ගෙනවිත් භාරදිය යුතුය.**(එසේ භාර දියයුතු වන්නේ අදියර අංක 04 යටතේ ඇති නාම ලේඛන අංක 07හි නම් සඳහන් ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සිසුන් පමණි).

**පැමිණිය යුතු ලිපිනය : බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,**
**අංක 616,**
**හයිලෙවල් පාර,**
**ගංගොඩවිල,**
**නුගේගොඩ**

***(විජේරාම මංසන්ධියේ සිට නුගේගොඩ දෙසට මීටර් 50 ක් දුරින්,මහජන බැංකුව ඉදිරිපිට)***

## උපාධි ලෝගු නිකුත් කිරීම

2022 නොවැම්බර් 12 සහ 13 යන දින දෙකෙන් එක් දිනයක දී ඔබ විශ්වවිද්‍යාලයට පැමිණිය යුතු අතර උපාධි ලෝගුව, උපාධි ප්‍රදානෝත්සවයට අදාල ප්‍රවේශ පත්‍ර (ඔබ සහ තවත් අමුත්තන් දෙදෙනෙකු සඳහා) නිකුත් කෙරේ. එම දිනවලදී  උපාධි ප්‍රදානෝත්සවය දිනයේදී ඡායාරූප ලබාගැනීම පිළිබඳ ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කෙරේ. ඊට අදාල වන තොරතුරු http://external.sjp.ac.lk යන වෙබ් අඩවිය ඔස්සේ ඉදිරියේ දී ඔබව දැනුවත් කරනු ඇත.

## පසු විපරම් පෝරමය (Feedback Form) පිරවීම

http://external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි සඳහන් පරිදි 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය-2022 යන ශීර්ෂය යටතේ ඇති පසු විපරම් පෝරමය **(Google Form 2)** නිසි පරිදි සම්පූර්ණ කර 2022.11.04 දිනට පෙර එවිය යුතු ය (submit).

**මින් ඉදිරියට 16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයට අදාල සියලු තොරතුරු පිළිබඳව ඔබ දැනුවත් කරනු ලබන්නේ අපගේ වෙබ් අඩවියේ "16 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය-2022" යන දිගුව හරහා පමණි. නැවත ලියාපදිංචි තැපැලෙන් කිසිදු ලිපියක් එවනු නොලබන බව කරුණාවෙන් දන්වා සිටිමි.**

**රාජකාරි දිනයන්හිදී කාර්යාලයීය වේලාවන්හි විමසීම් - 011-5929794**



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2022-11-02